# සිංහලයෝ සහ යුදෙව්වෝ

සතත අවස්ථා ප්‍රවාදය මහා පිපුරුමෙන් වෙන් වීමට ඉදිරිපත්කළ ප්‍රධාන ම කරුණ වූයේ විශ්වය අවකාශය වශයෙන් මෙන් ම කාලය වශයෙන් ද සමමිතික විය යුතු ය යන්න ය. මෙය අවකාශ කාලය පිළිබඳ අදහසෙන් ගළා ආවක් වුව ද අවකාශ කාලය පවා අවකාශය හා කාලය සම්බන්ධයෙන් සමමිතික නොවන බව අපි දන්නෙමු. කෙසේ වෙතත් සතත අවස්ථා ප්‍රවාදය ද අවුරුදු පණහක පමණ කාලයක් තුළ නොයෙකුත් සංශෝධනවලට භාජනය වෙමින් පවතියි. එහි නිරන්තරයෙන් සිදුවන ද්‍රව්‍ය නිර්මාණයක් ගැන අපි සඳහන් කෙළෙමු. මේ ද්‍රව්‍ය නිර්මාණය නිසා ස්කන්ධ සංස්ථිති නියමය අභියෝගයට ලක්වෙයි. එහෙත් විශ්වයේ ගුණ තේරුම් කිරීම සඳහා මේ ද්‍රව්‍ය නිර්මාණය සිදු විය යුත්තේ ඉතා සුළු වශයෙනි. ඒ කෙතරම් සුළු ද යත් එහි නිර්මාණය වීමේ ශීඝ්‍රතාවය අවුරුදු දහස් ගණනකට වරක් ගාළු මුවදොර පිටියේ එක් ප්‍රෝටෝනයක් නිර්මාණය වීමට සමාන වෙයි. මෙවැනි නිර්මාණයක් මගින් ස්කන්ධ සංස්ථිති නියමය අභියෝගයට ලක්වන නමුදු එය පරීක්ෂණාගාරයක දී නිර්ණය කළ හැක්කක් නොවේ. එබැවින් පරීක්ෂණාගාරයේ දී ශක්ති සංස්ථිති නියමය වලංගු වීමෙන් සතත අවස්ථා ප්‍රවාදය අසත්‍ය නොවෙයි.

මේ ඉතා වැදගත් කරුණකි. බටහිර විද්‍යාවේ ප්‍රවාද පරීක්ෂණාගාරයේ දී පරීක්ෂණවලට ලක් කළ හැකි යැයි බොහෝ විට කියැවෙයි. එහෙත් මෙවැනි කරුණක් පරීක්ෂණයට ලක් කිරීම අද නොව අනාගතයේ දී පවා කළ හැකි යැයි විශ්වාස කළ හැකි නොවේ. කෙසේ වෙතත් සතත අවස්ථා ප්‍රවාදයට නිරීක්ෂණ මගින් වෙනත් අභියෝග විය. ඒ සාකච්ඡා කිරීම මගේ අරමුණ නොවේ. හැල්ටන් ආර්ප් මහතා වැනි ඉතා සුළු පිරිසක් කියන ආකාරයට නම් සතත අවස්ථා ප්‍රවාදය මේ අභියෝග ජයගෙන ඇත.

කලින් සඳහන් කළ ආකාරයට සතත අවස්ථා ප්‍රවාදය බටහිර විද්‍යාවේ ප්‍රතික්ෂේප වන්නේ එහි නිගමන හා නිරීක්ෂණ අතර ඇති නොපෑහීම්වලට වඩා එය පදනම් වී ඇති දර්ශනයෙහි හා ආකල්පවල ස්වභාවය හේතු කොටගෙන ය. සතත අවස්ථා ප්‍රවාදයෙහි නිර්මාණයක් ඇත. එහෙත් එය එක් මොහොතක පමණක් සිදු නොවෙයි. මේ නිර්මාණය යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි දක්නට ලැබෙන නිර්මාණයට වඩා වෛදික චින්තනයෙහි කියැවෙන නිර්මාණයට සමීප වෙයි. සතත අවස්ථා ප්‍රවාදය බටහිර විද්‍යවේ ප්‍රතික්ෂේප වීමට බලපාන ප්‍රධාන ම කරුණ එය යැයි මම විශ්වාස කරමි. මහා පිපිරුම් ප්‍රවාදයට ද එතරම් සාක්ෂි නැති වුවද එය බටහිර විද්‍යවෙහි පිළිගැනීමට ලක් වන්නේ එය යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළ නිර්මාණය වී තිබීම හේතුවෙනි. සිංහල බෞද්ධ චින්තනය තුළ මේ ප්‍රවාද දෙකින් එකකටවත් ඉඩක් නැති බව පමණක් දැනට කිව යුතු ය.

මහා පිපිරුම් ප්‍රවාදය විසින් නිර්මාපකයා ප්‍රතික්ෂේප කරනු ලැබෙයි. එහෙත් විශ්වයට ආරම්භයක් ඇත යන්න හා ඒ ආරම්භයේ දී සිදුවන නිර්මාණය හැරෙන්නට වෙනත් නිර්මාණ නැත යන්න සමග එය එකඟ වෙයි. මහා පිපිරුම් ප්‍රවාදය පරණ තෙස්තමේන්තුවේ දක්නට ලැබෙන උත්පත්ති කතා දෙකින් එකක් සමග සංසන්දනය කරමු. පරණ තෙස්තමේන්තුව යනු යුදෙව් වර්ගයාගේ ඉතිහාසය දැක්වෙන පොත යනුවෙන් හැඳින්වීමේ වරදක් නැත. එහි යුදෙව් ඉතිහාසය මෙන් ම යුදෙව් ආගම ද, යම් ප්‍රමාණයකට යුදෙව් ආකල්ප ද සඳහන් වෙයි. කරුණු කිහිපයකින් පරණ තෙස්තමේන්තුව අපේ මහාවංශයට සමාන වෙයි. මහාවංශයෙහි දැක්වෙන්නේ සිංහලයන්ගේ (ඊනියා ලාංකිකයන්ගේ නොව), වඩා නිවැරදිව කියන්නේ නම් සිංහල බෞද්ධයන්ගේ ඉතිහාසයයි. එහි බුදු දහම විස්තර නොකෙරුණ ද, බුදුරජාණන් වහන්සේ ගැන විස්තරයක් වෙයි. සිංහල බෞද්ධ ආකල්ප කවරේදැයි අපට මහා වංශය නිවී සැනසිල්ලේ කියවා උගත හැකි ය. ජනවර්ගවල හෝ ජාතින්ගේ හෝ ඉතිහාස, ආකල්ප ගැන කියැවෙන පැරණිම පොත් දෙක මහාවංශය හා පරණ තෙස්තමේන්තුව ය. එහෙත් සිංහල බෞද්ධ චින්තනය ලෝකයේ අධිපතිවාදී චින්තනය නොවන බැවින් හා යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ලෝක අධිපතිවාදී චින්තනය වන බැවින් මේ පොත් දෙකට ලැබෙන්නේ දෙයාකාරයක සැළකිළි ය. පරණ තෙස්තමේන්තුව ලෝකයේ සම්භාව්‍ය කෘතියක් ලෙස පිළි ගැනෙන අතර මහාවංශය ලංකාව තුළ වුවත් නින්දාවට, පරිභවයට, උපහාසයට, අපහාසයට ලක්කෙරෙන කෘතියක් බවට පත් වී ඇත. දුප්පත් කමත් වලිගය නැති ගොනා වැනි යැයි සිංහල බෞද්ධ ජන කවියකු කියන්නට ඇත්තේ සිංහල ජාතිය ගැන සිතා නොවුවත් එය අද සිංහල බෞද්ධයනට සමස්තයක් ලෙස මනාව ගැළපෙයි.

© Prof. Nalin De Silva

මේ ලිපි පෙළෙහි තේමාව අපේ ප්‍රවාද නිර්මාණය කිරීම ය. අපේ ප්‍රවාද නිර්මාණය කර ගත හැක්කේ අපේ චින්තනය තුළ ය. එනම් සිංහල බෞද්ධ චින්තනය තුළ ය. සිංහල ක්‍රිස්තියානීන්, විශේෂයෙන් ම සිංහල කතෝලිකයන් මෙයින් කලබලයට පත්විය යුතු නොවේ. යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට වඩා සිංහල බෞද්ධ චින්තනය කතෝලිකයනට සමීප ය. එය පසුව තේරුම් යනු ඇත. අනෙක් අතට අද ලෝකයේ සියළුම බටහිර විද්‍යාඥයෝ, ඔවුන්ගේ ජාතිය, ආගම, සංස්කෘතිය කුමක් වුව ද, යුදෙව් ක්‍රිස්තියානි ග්‍රීක චින්තනය තුළ තම ප්‍රවාද නිර්මාණය කරති. නැතහොත් සතත අවස්ථා ප්‍රවාදය මෙන් ම ඒ ප්‍රවාද ද නොපිළිගැනෙනු ඇත. සිංහල ක්‍රිස්තියානින්ට, විශේෂයෙන් ම සිංහල කතෝලිකයනට සිංහල බෞද්ධ චින්තනය තුළ ප්‍රවාද නිර්මාණය කිරීම අපහසු කටයුත්තක් නොවනු ඇත.

මහාවංශය නොකියවූ කිසිවකුටවත් අපේ ප්‍රවාද නිර්මාණය කළ හැකි යැයි මම නොසිතමි. මහා පිපිරුම් ප්‍රවාදයට ද අදාළ බැවින් යුදෙව් චින්තනයෙහි හා සිංහල බෞද්ධ චින්තනයෙහි එක් ප්‍රධාන වෙනස්කමක් මෙහි දී සඳහන් කරමි. පරණ තෙස්තමේන්තුවට අනුව හා මහාවංශයට අනුව පිළිවෙළින් යුදෙව් වර්ගයා හා සිංහල බෞද්ධයෝ තෝරා ගනු ලැබූ ජනතාව වෙති. යුදෙව්වෝ දෙවියන් වහන්සේ, එනම් පරණ තෙස්තමේන්තුවේ සඳහන් යෙහෝවා දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබුවෝ වෙති. ඔවුහු අනෙක් මිනිසුන්ට වඩා වෙනස් වෙති. සමස්ත ලෝකයම දෙවියන් වහන්සේ ආදම්ට පවරා දුන්හ. දෙවියන් වහන්සේ විසින් මවන ලද ඉර හඳ, ගංගා පර්වත, ගහ කොළ, සතා සිවුපාවා පමණක් නොව ඒව ද ආදම්ගේ ස්වාමිත්වය යටතට පත් කෙරිණි. ඒව ආදම්ගේ ස්වාමිත්වය යටතට පත් කිරීමෙන් ගැහැණිය පිරිමියාට යටත් කර පවරා දෙන ලදී. මේ පැවරුමේ උරුමක්කරුවෝ යුදෙව්වෝ වෙති. යුදෙව්වෝ අනෙක් ජනවර්ග සමග මිශ්‍ර වීමට අකමැත්තක් දක්වති. යුදෙව්වෝ තම දෙවියන් වහන්සේ හා ආගම ලෝකය පුරාම පැතිරවීමට තෝරා ගනු ලැබූ ජනයා වෙති. යුදෙව්වන්ගේ කාර්යභාරය අද බටහිර සුදු පිරිමින් විශේෂයෙන් ම ඇමරිකා එක්සත් ජනපදයේ වසන්නන් පවරා ගෙන ඇත. අද මුළු ලෝකය ම එකම ගම්මානයක් වී ඇතැයි බටහිරයන් පවසන්නේ එහි ගම්මුලාදෑනියා ඇමරිකන් ජනාධිපති බව අපෙන් වසන් කරමිනි. අද බටහිරයෝ තම සංස්කෘතිය, චින්තනය, දැනුම ආදිය ලෝකය පුරා පැතිරවීමට තෝරා ගනු ලැබුවෝ වෙති.

සිංහල බෞද්ධයන් තෝරා ගනු ලැබුවේ කවුරුන් විසින් ද? මහාවංශය එයට කෙළින් පිළිතුරක් නොසපයයි. එහෙත් මෙරට බුදු සසුන පවතින බවත් සිංහලයන් එහි ආරක්ෂකයන් වන බවත් බුදු රජාණන් වහන්සේ අදහස් කළ බව මහාවංශයෙන් ගම්‍ය වෙයි. එසේ නම් සිංහලයන්, දුටුගැමුණු රජුගෙන් පසුව සිංහල බෞද්ධයන්, බුදු සසුනේ ආරක්ෂකයන් ලෙස තෝරා ගෙන ඇති බව මහාවංශය අපට දෙන අදහසයි. දුටුගැමුණු රජු යුද්ධ කෙළේ හුදෙක් රජ සැප පිණිස නොව බුදු සසුනේ චිරස්ථිතිය සඳහා බව මෙහි දී වැදගත් වෙයි. මේ සමග අප සඳහන් කළ යුතු තවත් කරුණක් වෙයි. මිහිඳු මහා හිමියන් මෙරටට වැඩම කිරීමෙන් පසුව දේවානම්පිය තිස්ස රජු අමතා ප්‍රකාශ කර ඇත්තේ මේ භූමිය රජුට පමණක් නොව සතා සිවුපාවනටත් අයිති බව ය. රජු පාලකයා නොව භාරකාරයා යන අදහස මිහිඳු හිමියෝ දේවානම්පිය තිස්ස රජුට දුන්හ.

සිංහලයන් හා යුදෙව්වන් තෝරාගනු ලැබූ පිරිස් වන නමුත් එහි ආකල්පීය වෙනසක් ඇත. යුදෙව්වන් තෝරා ගනු ලැබ ඇත්තේ ආක්‍රමණශීලී කටයුත්තකට ය. ඒ ලෝකයේ ස්වාමීත්වය සඳහා ය. ලෝකය පුරා යොහෝවා දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය හා තේජස පැතිරවීමට ය. එහෙත් සිංහලයන් තෝරාගෙන ඇත්තේ එවැනි ආක්‍රමණශීලී කටයුත්තක් සඳහා නොවේ. හුදෙක් බුදු සුසන රැක ගැනීම සඳහා ය. බුදු දහම පැතිරවීම සඳහා සිංහල බෞද්ධයෝ යුද්ධ නොකරති. එහෙත් බුදු සසුනට තර්ජනයක් වූ විට සිල් නොරකිති. අනෙක් අතට ලෝකයේ ස්වාමීත්වය තමන් සතු කර ගැනීමේ අදහසක් සිංහල බෞද්ධයනට නැත. ලෝකය තමන් වෙනුවෙන් මවා හෝ මැවී හෝ ඇති දෙයක් ලෙස සිංහල බෞද්ධයෝ නොසළකති. ඔවුන්ට අනුව ඒ ඒ පරම්පරාව ලෝකයේ, එනම් තම රටේ, භාරකරුවෝ පමණක් වෙති.

මහා පිපිරුමේ නිර්මාපකයකු නැති වුව ද ආරම්භයක් හා නිර්මාණයක් වෙයි. ලෝකය මැවීමට පෙර දෙවියන් වහන්සේ කෙළේ කුමක් දැයි දේව ධර්මාචාර්යවරයකුගෙන් අප ඇසුවහොත් ලැබෙන පිළිතුර හා විශ්වය නිර්මාණය වීමට පෙර කුමක් විණි ද යන්න බටහිර විශ්වවේදියකුගෙන් ඇසුවහොත් ලැබෙන පිළිතුර අතර වෙනසක් නැත. දේව ධර්මාචාර්යවරයා පවසනු ඇත්තේ දෙවියන් වහන්සේ කාලය ද මැවුවේ ලෝකය සමග බැවින් ලෝකය මැවීමට පසු පමණක් කාලය යන සංකල්පය ඇති වූ බව ය. පෙර හා පසු යන සංකල්ප ඇත්තේ කාලය මැවීමෙන් පසුව බව ඔහු

© Prof. Nalin De Silva

වැඩි දුරටත් පවසනු ඇත. කාලයක් නැතිව පෙරක් හා පසුවක් ගැන කතා කිරීම අර්ථ ශූන්‍ය ක්‍රියාවක් බව ඔහු පවසනු ඇත. එබැවින් ලෝකය මැවීමට පෙර යන්න අර්ථ ශූන්‍ය ප්‍රකාශයක් වෙයි. එයට හේතුව කාලය හා ඒ සමග පෙර හා පසු යන සංකල්ප ඇත්තේ කාලය මැවීමෙන් පසුව පමණක් නිසා ය. ලෝකය මැවීමට පෙර, පෙරක් නැත. එබැවින් ලෝකය මැවීමට පෙර කුමක් කෙළේ ද යන්න අරුත්සුන් ප්‍රශ්නයක් පමණකි. අරුත්සුන් ප්‍රශ්නවලට පිළිතුරු දීම අනවශ්‍ය යැයි දේව ධර්මාචාර්යවරයා පවසනු ඇත.

විශ්වය ඇතිවීමට පෙර කුමක් විණි ද යන ප්‍රශ්නයට බටහිර විශ්වවේදියකු දෙන්නේ ද එවැනි ම වූ පිළිතුරකි. විශ්වය ඇතිවීමත් සමග අවකාශ කාලය ඇති විණි. කාලයත් සමග පෙර හා පසු යන සංකල්ප ඇති වෙයි. පෙර හා පසු යන සංකල්ප අර්ථ දැක්වෙන්නේ කාලය නිර්මාණය වීමෙන් පසුව ය. එනම් අවකාශ කාලය නිර්මාණය වීමෙන් පසුව ය. එනම් විශ්වය නිර්මාණය වීමෙන් පසුව ය. එබැවින් විශ්වය නිර්මාණය වීමට පෙර යන්න අරුත් සුන් අදහසකි. විශ්වය නිර්මාණය වීමට පෙර කුමක් වීද යන අරුත් සුන් පැණයට පිළිතුරක් නැත.

මේ පිළිතුරු දෙක අතර වෙනසක් නැත. බටහිර විශ්වවේදය විසින් නිර්මාපකයා අස්කරනු ලැබ ඇති නමුදු යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අත්හැරී නැත. බටහිර විශ්වවේදියා සහ දේව ධර්මාචාර්යවරයා අතර වැඩි වෙනසක් නැත. දෙදෙනාට ම කාලයට පෙර පෙරක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva